**#MediaethicsSL #SinhalaPress #lka #SundayDivaina**

අප සමාජයේ කාලාන්තරයක් පුරාවට භාවිතා වන ඇතැම් හැඳින්වීම් සහ යෙදීම් වර්තමානයේදී ප්‍රශ්න කෙරෙන්නේ, ඒවායින් සමාජයේ යම් යම් කොටස් කොන් වීමකට ලක් කිරීම හෝ ලේබල්ගත කිරීම සිදුවන බැවිනි. මෙවන් හැඳින්වීම් ශිෂ්ට සමාජයෙන් බැහැර කොට, ඒ වෙනුවට වඩාත් මධ්‍යස්ථ හැඳින්වීම් භාවිතා නොකළ යුතුද යන්න සැබවින්ම වර්තමානයේදීද තර්ක විතර්ක මැදින් ඇදි යන මාතෘකාවකි. මෙවැනි හැඳින්වීම් සඳහා එක් උදාහරණයක් ලෙසින්, ස්ථුල පුද්ගලයෙකු හැඳින්වීම සඳහා විවිධ භාෂාවන්ගෙන් යොදාගැනෙනා යෙදුම් දැක්විය හැක. එහිදී ඉංග්‍රීසියෙන් එවන් පුද්ගලයෙකු හැඳින්වීමට ඇතැමෙකු භාවිතා කරනා "ෆැට්" යන්න පුද්ගලයෙකුගේ ස්වයං ප්‍රතිරූපයට සහ තමන් පිළිබඳව ඇති හැඟීමට සෘණාත්මක බලපෑමක් ඇති කරනු විනා, එම පුද්ගලයාගේ මානසිකත්වයට සහ ජීවන රටාවට ධනාත්මක බලපෑමක් ඇති නොකරන බවට වර්තමානයේ කතිකාවක් ගොඩ නැගී ඇත . මෙය එක් උදාහරණයක් පමණි. කෙසේ නමුත්, මීට ප්‍රතිවිරුද්ධ මතයන් පවත්නා බවද මෙහිදී සඳහන් කළ යුතු වේ.
මේ සම්බන්ධයෙන් ඔබ දරණා අදහස කුමක්ද? මෙවන් හැඳින්වීම් වලින් මිදී වඩාත් සිත් රිදවීම් වලින් හා ආත්ම සම්මානය පහත හෙලීම් වලින් තොර හැඳින්වීම් යොදා ගැනීම උචිත යැයි ඔබ දකින්නේද?